# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1761/20 – 2012 ජුනි 08 වැනි සිකුරාදා – 2012.06.08

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/14/25/2006.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම.

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියැවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2010 ජුනි මස 07 වැනි දින අංක 1657/4 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2010 ජුනි මස 03 වැනි දින දරන නියෝගයෙන්,

එක් පාර්ශවයක් වශයෙන්

ඒ. ජී. පී. ඩී. ඉන්ද්‍රසේකර මයා, අංක ඒ/631, බුද්ධංගල පාර, අම්පාර.

සහ

අනෙක් පාර්ශවය වශයෙන්

ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය, අංක 200, කිරුල පාර, කොළඹ 05.

අතර පවත්නා 2010 මැයි මස 20 වැනි දින දරන කාර්මික ආරාවුල පිළිබඳව කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් වී. අයි. ජයසූරිය මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය, අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ වන මම, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2010 ජුනි මස 03 වැනි දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2012 මැයි මස 10 වැනි දින,
කොළඹ දී ය.

06 – 830/1

මගේ අංකය: IR/14/25/2006.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

එක් පාර්ශවයක් වශයෙන්

ඒ. ජී. පී. ඩී. ඉන්ද්‍රසේකර මයා, අංක ඒ/631, බුද්ධංගල පාර, අම්පාර.

සහ

අනෙක් පාර්ශවය වශයෙන්

ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය, අංක 200, කිරුල පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්,

කොළඹ 08, මාතා පාර, මැනිං ටවුන් නිවාස යෝජනා ක්‍රමය, අංක B 9 හි එන්. ඒ. ජයවික්‍රම මහත්මිය පත්කර ඇය වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2012 මැයි මස 10 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/14/25/2006.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශවයක් වශයෙන්

ඒ. ජී. පී. ඩී. ඉන්ද්‍රසේකර මයා, අංක ඒ/631, බුද්ධංගල පාර, අම්පාර.

සහ

අනෙක් පාර්ශවය වශයෙන්

ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය, අංක 200, කිරුල පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය යටතේ පාලනය වන අම්පාර ටයර් කම්හලෙහි III - A ශ්‍රේණියේ භාරකාර ඉංජිනේරු වශයෙන් 2004.10.20 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ආවරණ පත්වීමක් ලැබූ ඒ. ජී. පී. ඩී. ඉන්ද්‍රසේකර මහතාට එම තනතුරෙහි ස්ථිරත්වය ලබා නොදීම හේතුවෙන්, ඔහුට යම් අසාධාරණයක් වූයේ ද යන්න හා අසාධාරණයක් වූයේ නම්, ඔහුට ලැබිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව ද වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2012 මාර්තු මස 23 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

06 – 830/2

මගේ අංකය: IR/22/30/2009.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

එක් පාර්ශවයක් වශයෙන්

එම්. ඩබ්. සරත් කීර්තිනාම මහතා, අංක 11/1, වතුර ටැංකිය පාර, සාලියපුර, අනුරාධපුරය.

සහ

අනෙක් පාර්ශවය වශයෙන්

ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය, අංක 200, කිරුල පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්,

පිළියන්දල, කැස්බෑව, සර්වෝදය මාවත, අංක 13/30, සරත් ලියනගේ මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2012 මැයි මස 10 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/22/30/2009.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශවයක් වශයෙන්

එම්. ඩබ්. සරත් කීර්තිනාම මහතා, අංක 11/1, වතුර ටැංකිය පාර, සාලියපුර, අනුරාධපුරය.

සහ

අනෙක් පාර්ශවය වශයෙන්

ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය, අංක 200, කිරුල පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ** වනුයේ,

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ අනුරාධපුර ඩිපෝවේ පළමු පංතියේ කාර්මික රියදුරෙකු ලෙස සේවය කළ එම්. ඩබ්. සරත් කීර්තිනාම මහතාට 2004.09.02 දිනැතිව ලබා දී ඇති විනය පරීක්ෂණ අභියාචන නියෝගය පරිදි ඔහුගේ සේවය අත්හිටුවා තිබූ 2002.08.07 දින සිට 2003.10.01 වැනි දින දක්වා වූ කාලසීමාවට අදාළ වැටුප් අහිමි කිරීමෙන් ඔහුට යම් අගතියක් සිදුවීණිද ? එසේ වූයේ නම් කුමන සහනයක් හිමිවිය යුතුද යන්න පිළිබඳව ද වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2012 මාර්තු මස 23 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

06 – 831

මගේ අංකය: IR/10/64/2009.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම.

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියැවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2011 සැප්තැම්බර් මස 09 වැනි දින දරන නියෝගයෙන්,

එක් පාර්ශවයක් වශයෙන්,

සෝමා විජේසූරිය මිය ඇතුළු විශ්‍රාමික සේවකයින්, අංක 34, මන්ත්‍රිමුල්ල පාර, අත්තිඩිය, දෙහිවල.

අනෙක් පාර්ශවය වශයෙන්,

1. ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව, රොටුන්ඩා ගොඩනැගිල්ල, අංක 109, ගාලු පාර, කොළඹ 03.
2. සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්, නිමාව. කොළොන්නාව.

අතර පවත්නා 2011 අගෝස්තු මස 23 වැනි දින දරන කාර්මික ආරාවුල පිළිබඳව කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ඊ. එන්. ජී. එදිරිසිංහ මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය, අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, වැඩබලන කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ජගත් බාලසූරිය වන මා, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2011 සැප්තැම්බර් මස 09 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**ආචාර්ය ජගත් බාලසූරිය,**
වැඩබලන කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2012 ජුනි මස 06 වැනි දින,
කොළඹ දී ය.

06 – 832/1

---

මගේ අංකය: IR/10/64/2009.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

එක් පාර්ශවයක් වශයෙන්,

සෝමා විජේසූරිය මිය ඇතුළු විශ්‍රාමික සේවකයින්, අංක 34, මන්ත්‍රිමුල්ල පාර, අත්තිඩිය, දෙහිවල.

අනෙක් පාර්ශවය වශයෙන්,

1. ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව, අංක 609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09.
2. සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්, නිමාව. කොළොන්නාව.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

වැඩ බලන කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ජගත් බාලසූරිය වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල

131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්,

දිවුලපිටිය, මාපලන්ගෙදර, කේ. එම්. සරත්චන්ද්‍ර මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ආචාර්ය ජගත් බාලසූරිය,**
වැඩබලන කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2012 ජූනි මස 06 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/10/64/2009.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)

එක් පාර්ශවයක් වශයෙන්,

සෝමා විජේසූරිය මිය ඇතුළු විශ්‍රාමික සේවකයින්, අංක 34, මන්ත්‍රීමුල්ල පාර, අත්තිඩිය, දෙහිවල.

අනෙක් පාර්ශවය වශයෙන්,

1. ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව, අංක 609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09.
2. සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්, නිමාව. කොලොන්නාව.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,**

1997 සිට 2002 කාලයේ ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාවේ සේවයේ සිට දැනට විශ්‍රාම ගොස් සිටින සෝමා විජේසූරිය මහත්මිය ඇතුලු ඒ5, ඒ6, ඒ7 ශ්‍රේණිවල සේවකයින් සඳහා 1997 සිට 2002 වර්ෂවලට අදාළව පසුකාලීනව සිදු කළ වැටුප් සංශෝධන ලබා නොදීමෙන් ඔවුනට යම් අසාධාරණයක් සිදුවිණිද ? එසේ වූයේ නම් ඒවා ලබා දෙන්නේ කුමන සේවායෝජකයන් විසින් කා සඳහා කුමන කාලයකට කොපමණ ප්‍රමාණයකින්ද යන්න වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2012 මැයි මස 24 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

06 – 832/2

2A - G16163 ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.